# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2396/60 - 2024 අගෝස්තු මස 09 වැනි සිකුරාදා - 2024.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, වෙක් පෝට් සිටි කළඹුබු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ, 2016 දෙසැම්බර් මස 06 දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයට තවදුරටත් වූ වශයෙන් මේ නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි :

> 2016 සැප්තැම්බර් මස 07 දින සිට ආරම්භව 2024 සැප්තැම්බර් මස 06 දිනයෙන් අවසන් වන අවුරුදු අට (08) ක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවක් (PIP) ව්‍යාපෘති සමාගම වෙත ප්‍රදානය කරනු ලැබුවා වූ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ 2016 දෙසැම්බර් මස 06 දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ (4) වන ඡේදය, ව්‍යාපෘති සමාගමේ ඉතිරි ක්‍රියාත්මක කිරීමේ වැඩකටයුතු සම්පූර්ණ කර ව්‍යාපෘති සමාගමේ සමස්ථ ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම පිණිස 2024 සැප්තැම්බර් මස 07 දිනයෙන් ආරම්භව 2027 ජුනි මස 30 දිනයෙන් අවසන්වන ලෙස බලපැවැත්වෙන පරිදි, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තවදුරටත් වූ මාස තිස්තුන (33)ක් සහ දින විසිහතර (24)ක් වූ කාල සීමාවක් සඳහා දීර්ඝ කිරීම මගින්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 අගෝස්තු මස 08 වැනි දින.

EOG 08 - 0138


1A - PG 6820 — 324 (2024/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*